සිංහල සාහිත්‍ය ඉතිහාසය සැකෙවින්

සිංහල නිර්මාණාත්මක ලේඛන අතර පැරණි ම ඒවා අපට හමු වන්නේ සීගිරි කුරුටු ලිපි අතර වේ. පද්‍ය නිර්මාණ බහුල ව දැකිය හැකි මෙම ලේඛන අතර ගද්‍යමය පාඨ කිහිපයක් ද අන්තර්ගත ය. සීගිරි කුරුටු ලිපි බහුතරයක් සවන සියවසේ සිට දසවන සියවස තෙක් අවධියට අයත් බව හඳුනාගෙන ඇත.

දම්පියා අටුවා ගැටපදය දැනට හමු වී ඇති පැරණි ම සිංහල කෘතියයි. දෙබිස වැජා අබා සලමෙවන් හෙවත් පස්වන කාශ්‍යප රජු විසින් මෙම කෘතිය රචනා කර ඇත. සිංහල භාෂාව හා එහි ඉතිහාසය හැදෑරීමේ දී මෙය ප්‍රබල මූලාශ්‍රයකි. විනය ග්‍රන්ථයක් වන **සිඛවළඳ හා සිඛවළඳ විනිස** ද සාමණේර භික්ෂූන් සඳහා විනය නීති සංග්‍රහයක් වන **හෙරණ සිඛ** හා **හෙරණ සිඛ විනිස** ද මේ කාලයේ දී ලියා ඇත. කාව්‍ය ශාස්ත්‍රයට අදාළ ව ලියවුණු **සියබස්ලකර** කෘතිය ද මේ යුගයේ බිහි වූ ලේඛන අතර වැදගත් වේ. එය දණ්ඩි නමැති භාරතීය පඬිවරයාගේ **කාව්‍යාදර්ශ** නම් අලංකාර ග්‍රන්ථයේ අනුවාදයකි. සියබස්ලකර කතුවරයා දසවන සියවස මැද භාගයේ ලංකාව පාලනය කළ සිවුවන සේන රජතුමා බව පිළිගැනේ. මෙම කෘතිය මෙන් ම සීගිරි කැටපත් පවුරේ නිර්මාණ ද මෙම අවධියේ ලංකා සමාජයෙහි කාව්‍ය රචනය පිළිබඳව පැවති උනන්දුව සංකේත්වත් කරයි.

දොළොස්වන සහ දහතුන්වන සියවස් අතර කාලය සැලකීමේ දී **සසදාවත, මුවදෙව්දාවත** හා **කව්සිළුමිණ** එකල බිහි වූ කව් පොත් වේ. මේ අතර, කව්සිළුමිණ සිංහල සාහිත්‍යයේ විශිෂ්ටතම පද්‍ය කෘතිය ලෙස ද සැලකේ. මේ අවධියට අදාළ ගද්‍ය ග්‍රන්ථ අතර ගුරුළුගෝමීන්ගේ **අමාවතුර** හා **ධර්ම ප්‍රදීපිකාව**, විද්‍යාචක්‍රවර්තිගේ **බුත්සරණ** කැපී පෙනෙයි. වර්තමානයේ පවා උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යාකරණ ශාස්ත්‍රයට අදාළ ව අධ්‍යයනය කෙරෙන **සිදත් සඟරාව** ද ඡන්දස් ශාස්ත්‍රයට අදාළ ව අධ්‍යයනය කෙරෙන **එළු සඳැස් ලකුණ** ද මෙම වකවානුවේ දී ලියන ලදැයි සැලකේ. දැනට විද්‍යමාන නොවන පැරණි පද්‍ය කාව්‍යවලින් උපුටාගත් පාඨ මේ කෘති දෙකෙහි ම ඇතුළත් වේ. ඒවා ඉපැරණි සිංහල සාහිත්‍යය පිළිබඳ ගවේෂණයේ දී මනා පිටුබලයක් සපයයි.

දීර්ඝ ගද්‍ය ග්‍රන්ථ හා සිවුපද කාව්‍ය ග්‍රන්ථ ලිවීම ආරම්භ වී ඇත්තේ දහතුන්වන සහ දහහතරවන සියවස් හි දී පමණ ය. ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද **සද්ධර්මරත්නාවලිය** සහ මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද **පූජාවලිය** දීර්ඝ ගද්‍ය කෘති අතර ප්‍රධාන වේ. සිංහල ජන ජීවිතය හා බැඳුණු **පන්සිය පනස් ජාතක පොත** ද වැදගත් දීර්ඝ ගද්‍ය ග්‍රන්ථයකි. එය **පාලි ජාතකට්ඨකතාව** ආශ්‍රයෙන් රචනා කර ඇත.

පැරණි ම සිංහල සිවුපද කාව්‍ය ග්‍රන්ථ ලෙස සැලකෙන්නේ **තිසර සන්දේශය** හා **මයූර සන්දේශයයි.** පක්ෂීන් අත දෙවියන්ට යැවෙන පණිවුඩ සේ ලියවී ඇති මෙම සිවුපද කාව්‍ය කෘති, සන්දේශ සාහිත්‍යය නමින් ද හැඳින්වේ. මෙම සම්ප්‍රදායට ම අනුගත **පරෙවි, ගිරා, සැළලිහිණි, හංස, කෝකිල** හා **සැවුල්** ආදි සන්දේශ කාව්‍ය පහළොස්වන සියවසේ දී පමණ ලියවිණි.

කව්සිළුමිණ ආදි මහා කාව්‍ය ගණයට අයත් වන, තොටගමුවේ රාහුල හිමියන් රචනා කළ **කාව්‍යශේඛරය** හා වීදාගම මෛත්‍රෙය හිමියන් රචනා කළ **ගුත්තිල කාව්‍යය** මේ අවධියට අයත් සිවුපද කාව්‍ය අතර සුවිශේෂ වේ.

ඉහත දක්වුණු සාහිත්‍ය නිර්මාණ සියල්ල සම්භාව්‍ය සාහිත්‍ය ගණයට අයත් කෙරෙන අතර මේ පෙළෙහි අවසාන පුරුක ලෙස සැලකෙන අලගියවන්න මුකවෙටිගේ **කුස ජාතක කාව්‍යය** ද සිවුපද කාව්‍ය ග්‍රන්ථයකි.

සාහිත්‍යකරණයට රජුන්ගේ දායකත්වය ලැබීම ලංකා ඉතිහාසයේ මුල් අවධියේ සිට සොළොස්වන සියවස දක්වා කැපී පෙනෙන ලක්ෂණයකි. අනුරාධපුර යුගයේ විසූ පස්වන කාශ්‍යප හා සිවුවන සේන, දඹදෙණි යුගයේ විසූ දෙවන පරාක්‍රමබාහු සහ කෝට්ටේ යුගයේ විසූ සවන පරාක්‍රමබාහු යන රජවරු ග්‍රන්ථ කර්තෘවරු ද වෙති. වංසකථාවලට අනුව දෙවන මුගලන් රජු මහා සාහිත්‍යධරයෙකි. බුද්ධදාස, සිවුවන පරාක්‍රමබාහු යන රජවරු ද, ලීලාවතී රැජින ද දෙවන පරාක්‍රමබාහු රජ සමයෙහි විසූ දේවප්‍රතිරාජ නම් අමාත්‍යවරයා ද, නන්නූරුතුනෛයාර් අමාත්‍යවරයා ද උලකුඩය දේවිය ද සාහිත්‍යකරණයට අනුග්‍රහ දක්වූ අය ලෙස දැක්වෙති. පොත් පිටපත් කිරීම සඳහා විශේෂ නිලධාරීන් කොටසක් පත් කර, ඔවුන්ට වැටුප් ගෙවන ලද බවට ද සාධක හමු වේ. පසුකාලීන ව විදේශීය ආක්‍රමණ නිසා පන්සල් විහාරාරාම විනාශ කිරීමේ දී පන්සල්වල පැවති පොත්ගුල් විනාශ වී යෑම ද අනුබල දෙන ආරාමික පරිසරයට හානි පැමිණීම ද වැනි කරුණු හේතුවෙන් සිංහල සාහිත්‍යයේ පරිහානියක් ඇති විය. නැවත සාහිත්‍යකරණයට ප්‍රබෝධයක් ඇති කිරීමට දහඅටවන සියවසේ වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් කරන ලද ශාසනික ප්‍රතිසංස්කරණ හේතු විය. එහෙත් එය ප්‍රබල සාහිත්‍ය නිර්මාණ බිහි වීමට තරම් ප්‍රමාණවත් නො වී ය. මෙතෙක් ප්‍රභූ ජනයා සහ භික්ෂූන් ප්‍රමුඛ ව නියැලුණු ග්‍රන්ථකරණයට සාමාන්‍ය ජනතාව ප්‍රවිෂ්ට වීම මෙකල දැකිය හැකි ය. එයට නිදසුන් කළ හැකි විශේෂ ම කෘති දෙක වෙස්සන්තර ජාතක කාව්‍යය හා යසෝදරාවතයි.

පුර්තුගීසීන් බයිබලය ආශ්‍රිත කතා සිංහලයට පරිවර්තනය කිරීම ආරම්භ කිරීම ද දහඅටවන සියවස මැද භාගයේ දී ලන්දේසීන් විසින් මෙරටට මුද්‍රණ ශිල්පය හඳුන්වා දෙමින් බයිබලය සිංහලයට පරිවර්තනය කර මුද්‍රණය කිරීම ද සිංහල ග්‍රන්ථකරණයේ නව වෙනස්කම් විය. දහනවවන සියවසේ දී ඉංග්‍රීසීහු ද මෙරට මුද්‍රණාල පිහිටුවා, බයිබලයට අමතර ව පුවත්පත්, සඟරා ද සිංහල පාඨකයන්ට හඳුන්වා දුන්හ. මෙම ක්‍රියාවලියට සමගාමී ව සිංහල බෞද්ධ ප්‍රකාශන මුද්‍රණයට ස්වකීය මුද්‍රණාල පිහිටුවා ගැනීමට ස්වදේශික ජනතාව ද උත්සුක වූහ. නව පිරිවෙන් ආරම්භ වීමත් සමග පැරණි සිංහල පොත් හා සඟරා මුද්‍රණයට ඔවුහු පෙලඹුණහ. මේ අතර ඉංග්‍රීසි ප්‍රබන්ධ කතා අනුකරණය කරමින් දේශීය ජන ජීවිතය වස්තු කර ගත් ප්‍රබන්ධ කතා ලිවීමට සිංහල රචකයෝ යොමු වූහ.

මෙලෙස ආරම්භ වුණු නූතන සිංහල සාහිත්‍යයේ පුරෝගාමීන් ලෙස සැලකෙන්නෝ පියදාස සිරිසේන, ඩබ්ලියු.ඒ. සිල්වා, කුමාරතුංග මුනිදාස, රැපියෙල් තෙන්නකෝන්, මාර්ටින් වික්‍රමසිංහ, මහගමසේකර, ජී.බී. සේනානායක, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ආදීහු ය. ඔවුහු සම්භාව්‍ය සාහිත්‍යයෙන් සහ විශ්ව සාහිත්‍යයෙන් ආභාසය ලබමින් නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රය පෝෂණය කළහ. ඔවුන්ගේ ආභාසය ලබමින්, ලෝකයේ නව සාහිත්‍ය ප්‍රවණතා ගවේෂණය කරමින් නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයට එක් වූ ලේඛකයෝ බොහෝ වෙති. වර්තමාන සිංහල සාහිත්‍යය මේ සියල්ල ඇසුරේ නිර්මාණය වෙයි.